**අකුරණ ප්‍රාදේශීය සභාව**
**මහනුවර දිස්ත්‍රික්කය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2013 මැයි 31 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති අකුරණ ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ගිණුම්කරණ අඩුපාඩු**

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති රු. 121,177 ක් වටිනාකමැති ආයුර්වේද ඖෂධ තොගය ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ වෙන්දේසි මගින් විකුණා තිබූ භාණ්ඩ අයිතම 118 ක වටිනාකම අදාළ වත්කම් ගිණුම් වලින් සහ ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක ගිණුමෙන් ඉවත් කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල රු. 914,020 ක් වැය කර නිම කර තිබූ කර්මාන්ත සහ විවිධ ව්‍යාපෘති 5ක වටිනාකම, ස්ථාවර වත්කම් ගිණුමට සහ ප්‍රාග්ධන යෙදුමෙන් ආදායමට දායකවීමේ ගිණුමට සටහන් කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය සඳහා වූ වෙළඳ බලපත්‍ර ගාස්තු බිල් කිරීමක් සිදු නොකර මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ඉ) ජල ගාස්තු වලට අදාළව ලේඛනයක් නඩත්තු කර නොතිබූ අතර මුදල් පදනම මත ගිණුම්ගත කර තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ පොදු පරිපාලන සැපයුම් සහ උපකරණ වියදම රු. 1,666,925 ක් වූ අතර ආදායම් වියදම් ගිණුමෙහි සටහන් කර තිබූ වටිනාකම රු.1,809,949 ක් වූ බැවින් රු.143,024 ක සැපයුම් හා උපකරණ ගිණුම්වල වැඩියෙන් දක්වා තිබුණි.

(උ) පසුගිය වර්ෂයේදි පරිත්‍යාගශිලියකු වෙතින් තෑගි ඔප්පුවක් මගින් පවරා දී තිබූ දේපල අගය කර නොතිබුණි. එම දේපල ඉඩම් හා ගොඩනැගිලි ලේඛනයට ඇතුලත් කර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේ ගිණුම්වලට ඇතුලත් කර ද නොතිබුණි.

**1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම නිසා එකතුව රු. 12,674,932 ක් වූ ගනුදෙනු විගණනයේදි සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරිමට නොහැකි විය.

**2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 6,076,356 ක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.5,226,374 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. '000 | රු. '000 | රු. '000 |
| (i) වරිපනම් හා බදු | 3,025 | 5,905 | 1,792 |
| (ii) බදු කුලී | 5,053 | 2,889 | 623 |
| (iii) බලපත්‍ර ගාස්තු | 2,105 | 2,707 | - |
| (iv) වෙනත් ආදායම් | 5,065 | 5,218 | 6,061 |

2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පිළිබඳ විස්තර පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 337,325 |
| (ii) මුද්දර ගාස්තු | 5,724,350 |

2.2.3 කඩ බදු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) පොදු වෙළඳපල සංකීර්ණයේ බිම්මහලේ පිහිටි කඩකාමර 18 ක් බදු දීමට ටෙන්ඩර් කැඳවා නොතිබූ අතර එම කඩ කාමර සඳහා අකුලන දොරවල් (Roller Door) සවිකර තිබූ අතර ඒවායින් දොරවල් කොටස් කිහිපයක් සොරුන් විසින් ගලවාගෙන ගොස් තිබුණි. මෙම කඩකාමර වලින් ඉපයිමට හැකිව තිබූ ආදායම ද, දොරවල් වලට සිදු වි ඇති හානියද ඇතුළුව විශාල පාඩුවක් සභාවට සිදු වි තිබුනද ඒ පිළිබඳව පරීක්ෂණයක් විගණන දින දක්වා සිදු කර නොතිබුණි.

(ආ) කඩ බදුකරුවන් සහ සභාව අතර ඇති ගිවිසුමේ කොන්දේසි අංක 10 අනුව කඩකාමර අතුරු බදුදිම, උකස් කිරිම, පැවරිම ආදිය නොකල යුතු බව දැන්වුවත් අතුරු බදුදිම සිදු කර ඇති බව 2013 පෙබරවාරි 27 දින කරන ලද පරීක්ෂාවේදි නිරීක්ෂණය විය.

2.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) අලවතුගොඩ පුස්තකාලයේ අස්ථානගතවූ පොත් 422 ක් වටිනාකම රු. 48,607 ක් අයකර ගත යුතු පාර්ශව හඳුනාගෙන අයකිරිමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2005 වර්ෂයේදි ස්ථාන මාරුවිම ගොස් තිබූ නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.39,875 ක ආපදා ණය ශේෂ අයකරගෙන නොතිබුණි.

2.4 අභ්‍යන්තර විගණනය

ආයතනය තුල ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර නොතිබුණි.

3. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) වත්කම් කළමනාකරණය